**අභ්‍යාස**

01. සීමිත දුම්බර සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙළ කිරීමෙන් පසු ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | රු. '000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 4,000 |
| පොදු සංචිත | 860 |
| රඳවාගත් ලාභය | 612 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 520 |
| 2020.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ | 52 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 133 |
| 2020.03.31 දිනට තොගය | 1,500 |
| මුදල් හා බැංකු ශේෂය | 742 |
| දේපළ පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | 3,040 |
| භාවිත අයිතිය සහිත වත්කම් (ශුද්ධ අගය) | 2,800 |
| 8% බැංකු ණය | 400 |
| 10% ණයකර | 200 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 1,000 |
| ඉදිරියට කළ ගොඩනැගිලි කුලී (2020/03/31 දිනට) | 150 |
| ස්ථාවර තැන්පතු (වසර 2ක්) | 1,000 |
| භාණ්ඩාගාර බිල්පත් (ත්‍රෛයිමාසික) | 200 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | 100 |
| 2020.03.31 දිනට ගෙවිය යුතු බැංකු ණය | 50 |
| 2020.03.31 දිනට ආදායම් බදු වෙන්කිරීම | 150 |
| 2020.03.31 දිනට ගෙවිය යුතු ණයකර පොලී | 20 |
| කල්බදු වගකීම | 1,800 |
| කල්බදු වගකීම (ජංගම කොටස) | 600 |
| 2020.03.31 දිනට උපචිත විගණන ගාස්තු | 175 |

**අවශ්‍ය වන්නේ,**

1) සීමිත දුම්බර සමාගමේ 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

02. සීමිත හිරු පොදු සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙළ කිරීමෙන් පසු ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | රු'000 |
|---|---|
| දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය) | 14,000 |
| ස්ථාවර තැන්පතු | 1,000 |
| 2020.03.31 දිනට තොග | |
| අමුද්‍රව්‍ය තොග | 1,300 |
| නොනිමි තොග | 700 |
| නිමි තොග | 2,300 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 2,800 |
| වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම | 500 |
| ඉදිරියට ගෙවූ රක්ෂණය | 500 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 200 |
| මුදල් හා බැංකු ශේෂය | 1,200 |
| දිගුකාලීන ණය | 2,000 |
| කල්බදු වගකීම | 3,400 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 1,250 |
| 2020.03.31 දිනට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් | 120 |
| 2020.03.31 දිනට ගෙවිය යුතු භාරකාර අරමුදල් | 30 |
| 2020.03.31 දිනට උපචිත ණය පොළී | 200 |
| වගකීම් සහතික සඳහා ප්‍රතපාදන | 400 |
| දිගුකාලීන ණය (ජංගම කොටස) | 450 |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු වගකීම | 50 |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | 300 |
| කල්බදු වගකීම (ජංගම කොටස) | 800 |
| භාවිත අයිතිය සහිත වත්කම් (ශුද්ධ අගය) | 5,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 12,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 1,500 |
| පොදු සංචිතය | 2,500 |
| රඳවාගත් ඉපයුම් | 3,700 |

**<u>අවශ්‍ය වන්නේ,</u>**

සීමිත හිරු සමාගමේ 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

03. සීමිත තිළිණ පොදු සමාගමේ 2019.03.31 දිනට පිළියෙළ කළ ගිණුම් වාර්තා වලින් දේපළ පිරියත හා උපකරණ සම්න්ධව පහත ශේෂයන් උපුටා ගෙන ඇත.

| 2019.04.01 දිනට ශේෂයන් | පිරිවැය (රු'000) | සමුච්චිත ක්ෂය (රු'000) | ක්ෂය අනුපාතය |
|---|---|---|---|
| ඉඩම් | 18,000 | - | - |
| ගොඩනැඟිලි | 8,000 | 1,200 | 5% |
| මෝටර් රථ | 9,000 | 2,400 | 10% |
| යන්ත්‍ර හා පිරියත | 7,000 | 2,200 | 10% |
| කාර්යාල උපකරණ | 4,000 | 1,000 | 5% |

2020.03.31 න් අවසන් වර්ෂය තුළදී දේපළ පිරියත හා උපකරණ සම්බන්ධව පහත ගණුදෙණු සිදුවිය.

1) 2020.03.31 දිනට ඉඩම ප්‍රථම වතාවට රු. 19,500,000 කට ප්‍රත්‍යාගණනය කර ඇත.
2) 2019.04.01 දින ගොඩනැගිලි ප්‍රථම වරට රු. 7,200,000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.
3) 2017.04.01 දින මිලදී ගෙන තිබූ පිරිවැය රු. 3,000,000 ක් වූ මෝටර් රථයක් 2019.10. 01 දින රු. 1,700,000 කට විකුණන ලදි. එදිනම රු. 4,000,000 කට නව මෝටර් රථයක් මිලදී ගන්නා ලදි.
4) 2020.01.01 දින සමාගම බැංකු ණයක් ගෙන පිළිවෙළින් රු. 4000,000 හා රු. 200,000 වටිනා යන්ත්‍ර හා කාර්යාල උපකරණ මිලදී ගන්නා ලදි.
5) සමාගම ඉහත ක්ෂය අනුපාතයන් මත පදනම්ව දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

**<u>අවශ්‍ය වන්නේ,</u>**

ඉහත තොරතුරු ඇසුරින් සීමිත තිළිණ පොදු සමාගමේ 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා දේපළ පිරියත හා උපකරණ සටහන පිළියෙළ කරන්න.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පිළිතුරු

01.

**සීමිත දුම්බර සමාගමේ 2020.03.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| **ජංගම නොවන වත්කම්** | **සටහන්** | (රු. '000) | (රු. '000) |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | | | 3,040 |
| භාවිත අයිතිය සහිත වත්කම් | | | 2,800 |
| ස්ථාවර තැන්පතු | | | 1,000 |
| | | | 6,840 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 1,500 | |
| වෙළඳ ලැබිය යුතු ද | 1 | 468 | |
| වෙනත් ලැබිය යුතු දෑ | 2 | 250 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 3 | 942 | 3,160 |
| මුළු වත්කම් | | | 10,000 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | |
| සාමාන්‍ය කොටස් | | | 4,000 |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 1,000 | |
| පොදු සංචිත | | 860 | |
| රඳවා ගත් ඉපයුම් | | 612 | 2,472 |
| **ජංගම නොවන වගකීම** | | | |
| 8% බැංකු ණය | | 400 | |
| කල්බදු වගකීම | | 1,800 | |
| ණයකර | | 200 | 2,400 |
| **ජංගම වගකීම්** | | | |
| කල්බදු වගකිම | | 600 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 133 | |
| බැංකු ණය | | 50 | |
| උපචිත ආදායම් බදු | | 150 | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 4 | 195 | 1,128 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 10,000 |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**සටහන්**

1) <u>වෙළඳ ලැබිය යුතු දෑ</u>

| | (රු. '000) |
|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 520 |
| වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ | (52) |
| අලාභ සඳහා ඉඩහැරීම | **468** |

2) <u>වෙනත් ලැබිය යුතු දෑ</u>

| | (රු. '000) |
|---|---|
| ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලී | 150 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී | 100 |
| | **250** |

3) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

| | (රු. '000) |
|---|---|
| මුදල් හා බැංකු ශේෂය | 742 |
| භාණ්ඩාගාර බිල්පත් | 200 |
| | **942** |

4) <u>වෙනත් ගෙවිය යුතුදෑ</u>

| | (රු. '000) |
|---|---|
| උපචිත ණයකර පොලී | 20 |
| උපචිත විගණන ගාස්තු | 175 |
| | **195** |

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්ද්‍රන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

02.

**සීමිත හිරු සමාගමේ 2020.03.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| **ජංගම නොවන වත්කම්** | සටහන් | (රු. '000) | (රු. '000) |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | | | 14,000 |
| භාවිත අයිතිය සහිත වත්කම් | | | 5,000 |
| ස්ථාවර තැන්පතු | | | 1,000 |
| | | | 20,000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 1 | 4,300 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 2 | 2,300 | |
| වෙනත් ලැබිය යුතු දෑ | 3 | 700 | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 1,200 | 8,500 |
| මුළු වත්කම් | | | 28,500 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | |
| සාමාන්‍ය කොටස් | | | 12,000 |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 1,500 | |
| පොදු සංචිත | | 2,500 | |
| රඳවා ගත් ඉපයුම් | | 3,700 | 7,700 |
| **ජංගම නොවන වගකීම** | | | |
| දිගුකාලීන ණය | | 2,000 | |
| කල්බදු වගකීම | | 1,800 | 5,400 |
| **ජංගම වගකීම්** | | | |
| දිගුකාලීන ණය | | 450 | |
| කල්බදු වගකිම | | 600 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 1,250 | |
| වෙනත් ගෙවිය යුතු දෑ හා ප්‍රතිපාදන | 4 | 1,050 | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 50 | 3,400 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 28,500 |

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්දන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

**සටහන්**

1) තොග

| | (රු. '000) |
|---|---|
| අමුද්‍රව්‍ය | 1,300 |
| නොනිමි | 700 |
| නිමි | 2,300 |
| | **4,300** |

2) වෙළඳ ලැබිය යුතු දෑ

| | (රු. '000) |
|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 2800 |
| (වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකර අලාභ සඳහා ඉඩහැරීම | (500) |
| | **2,300** |

3) වෙනත් ලැබිය යුතු දෑ

| | (රු. '000) |
|---|---|
| ඉදිරියට ගෙවූ රක්ෂණය | 500 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 200 |
| | **700** |

4) වෙනත් ගෙවිය යුතු දෑ හා ප්‍රතිපාදන

| | |
|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් | 120 |
| සේවක භාරකාර අරමුදල් | 30 |
| ගෙවිය යුතු ණය පොළී | 200 |
| වගකීම් සහතික ප්‍රතිපාදන | 400 |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | 300 |
| | **1,050** |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

03.

**දේපළ පිරියත උපකරණ සටහන**

(රු. '000)

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | යන්ත්‍ර පිරියත | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2019.04.01 දිනට ශේෂය | 18,000 | 8,000 | 9,000 | 7,000 | 4,000 | 46,000 |
| මිලදී ගැනීම | | | 4,000 | 4,000 | 2,000 | 10,000 |
| ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | 1,500 | 400 | | | | 1,900 |
| ඉවත් කිරීම් | | | (3,000) | | | (3,000) |
| ප්‍රත්‍යාගණන මත ක්ෂය ඉවත් කිරීම | | (1,200) | | | | (1,200) |
| 2020.03.31 ට ශේෂය | **19,500** | **7,200** | **10,000** | **11,000** | **6,000** | **53,700** |
| සමුච්චිත ක්‍ෂය | | | | | | |
| 2019.04.01 දිනට ශේෂය | | 1,200 | 2,400 | 2,200 | 1,000 | 6,800 |
| වර්ෂයට අදාළ ක්ෂය | | 360 | 950 | 800 | 225 | 2,335 |
| ඉවත්කිරීම් | | | (750) | | | (750) |
| ප්‍රත්‍යාගණනය මත ක්ෂය ඉ.කි | | (1,200) | | | | (1,200) |
| 2020.03.31 ට ශේෂය | - | 360 | 2,600 | 3,000 | 1,225 | 7,185 |
| 2020.03.31 ට ධාරණ අගය | **19,500** | **6.840** | **7,400** | **8,000** | **4,775** | **46,515** |


Copyright © www.e-thaksalawa.moe.gov.lk